1. **මොඩියුලයේ නම - අධ්‍යාපනයට සම්බන්ධ අණ පනත් හා අධ්‍යාපන ඉතිහාසය**
2. අරමුණ -

   ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදී ගුරුවරයෙකුට පැවරෙන වගකීම් හා යුතුකම්වලට බලපාන නීති පද්ධතිය හඳුනාගැනීම.
3. අපේක්ෂිත ඵලය -

   මානසික හා කායික වශයෙන් නොමේරූ තැනැත්තන් ලෙස සලකන ළමයින් සම්බන්ධව ගුරුවරුන් සතු නෛතික වගකීම් හා යුතුකම් අවබෝධ කර ගැනීම තුලින් ළමයින්ට භුක්ති විඳීමට හිමිකම් ඇති අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.
4. අන්තර්ගතය

   4.1 හැඳින්වීම

   මානසික හා කායික වශයෙන් නොමේරූ වයසේ පසුවන ළමයින්, පවුල තුල, පාසල තුල හා සමාජය තුල වැඩිහිටියන්ගේ රැකවරණය යටතේ වැඩෙති. වර්ධනය සඳහා ළමයින්ට ළමා වීමේදී භුක්ති විඳීමට හිමිකම් ඇති හිමිකම භුක්ති විඳීමට අවස්ථාව සැලසිය යුතුවේ. එසේ යොමුවූවිට සමහරවිට ළමයින්ට ළමා වියේදීම ජීවිතය ඇති හිමිකමද අහිමි වේ. එසේ නොවී ජීවත්වීමේ අයිතිය සුරැකුනොත් ළමයා මානසික හා කායික වූ විවිධ උපද්‍රවවලට ගොදුරු වේ. මෙවැනි උපද්‍රවවලට ගොදුරු නොවී හා ජීවත්වීමට ඇති හිමිකම් සුරක්ෂිත කරමින් ළමයාට රැකවරණය සැලැස්විය යුතු එක් වැදගත් ස්ථානයක් නම් පාසලයි. පාසලේදී මේ වගකීම පැවරෙන්නේ පාසලේ මුල් ගුරුවරයාට හා ගුරුවරුන්ටය. මේ සඳහා ළමයින්ගේ හිමිකම්වලට බලපාන නීති පද්ධතිය පිළිබඳ ගුරුවරුන් දැනුවත්ව සිටීම අත්‍යවශ්‍ය වේ. මේ මොඩියුලයෙන් සාකච්ඡා කරන්නේ ළමයින්ගේ හිමිකම්වලට අදාලව ගුරුවරුන් දැනුවත් විය යුතු නීති පද්ධතිය පිළිබඳවයි. එය ළමයින්ගේ හිමිකම්වලට බලපාන අධ්‍යාපනයට සම්බන්ධ අණ පනත්, රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන් සම්බන්ධවයි.

   4.2 අනු මාතෘකා

   - ළමයා හා වැඩිහිටියා අතර ඇති සම්බන්ධය නෛතික දෘෂ්ටි කෝණයෙන් විමසා බැලීම.
   - ළමයාගේ හිමිකම් රැකීමේදී ගුරුවරයාගේ භූමිකාව සාර්ථකව ඉටු කිරීමට බලපාන නීති පද්ධතිය.
   - අධ්‍යාපනය සඳහාම පැනවූ අණ පනත්.
   - අධ්‍යාපනයට බලපාන රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන්.
   - ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන පොදු හා පෞද්ගලික නීති.
   - නීතිය ක්‍රියාවට නැගීමට සම්බන්ධ ව්‍යවහාරයන් හා සංවිධාන.

සැසි සැලැස්ම

| අංකය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම්/සම්පත් | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|---|
| 1 | ළමයා හා වැඩිහිටියා අතර ඇති සම්බන්ධය නෛතික දෘෂ්ටි කෝණයෙන් විමසා බැලීම. | ළමයා වයස අවුරුදු 18 ට අඩු තැනැත්තා යන නීතිමය නිර්වචන විමසා බැලීම.<br>ළමයා සම්බන්ධ වෙනත් නීතිමය අර්ථ කථන විමසා බැලීම.<br>• එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>• 1979 අංක 2 ළමයින් හා තරුණයින් පිළිබඳ ආඥා පනත<br>• 1978 අංක 12 සාප්පු හා කාර්යාල සේවක පනත<br>ළමයා යනු කායික හා මානසික වශයෙන් නොමේරූ විවිධ නොහැකියාවන් ඇති වැඩිහිටියන් විසින් පරිපෝෂණය හා රැකවරණය සැලසිය යුතු තැනැත්තෙකු බව හඳුනාගැනීම.<br>ළමයාට සම්බන්ධ වැඩිහිටියන් සිටින පවුල, පාසල, සමාජය ගැන විමසා බැලීම. | • අත් පත්‍රිකා<br>• Multimedia Projector<br>• OHP<br>• ප්ලැටිග්නම් පෑන් හා කඩදාසි<br>• White Board හා Marker | මූලික හැඳින්වීම.<br>අත් පත්‍රිකාව සාකච්ඡාවට භාවිතා කිරීම.<br>අදාල අණ පනත් හා මූලාශ්‍ර ලබාදී ළමයා පිළිබඳ නිර්වචන කණ්ඩායම් මගින් එක්රැස් කිරීම.<br>• ළමා අයිතිවාසිකම්<br>• ළමයින්ගේ වගකීම්<br>• වැඩිහිටියන්ගේ වගකීම්<br>• වැඩිහිටියන්ගේ අයිතිවාසිකම්<br>• ළමා වයසේ නොහැකියාවන්<br>• වැඩිහිටියන් විසින් ළමයින් පරිපෝෂණය කිරීම<br>• වැඩිහිටියන් විසින් ළමයින්ට රැකවරණය සැලසීම<br>යන අනු මාතෘකා කණ්ඩායම්වලට බෙදාදී, මූලාශ්‍ර සපයා, පැවරුම් හා ඉදිරිපත් කිරීම් කිරීම. | පැය 4 |
| 2 | ළමයාගේ හිමිකම් රැකීමේදී ගුරුවරයාගේ පැමිණීම සාර්ථකව ඉටු කිරීමට බලපාන නීති පද්ධතිය. | නීති පද්ධතියක් යනු කුමක්ද?<br>ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය පිළිබඳ මූලික හැඳින්වීම.<br>නීති-රෙගුලාසි-චක්‍රලේඛ නියමයන් පිළිබඳව විමසා බැලීම.<br>ළමයාට සම්බන්ධව ගුරුවරයාගේ | • අත් පත්‍රිකා<br>• Multimedia Projector<br>• OHP<br>• සුදු කඩදාසි<br>• ප්ලැටිග්නම් පෑන්<br>• White Board හා Marker | Legal System හෙවත් නීති පද්ධතියක් නිර්වචනය කිරීම.<br>ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය විමසා බැලීම.<br>නීති රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන් අතර සමානකම් හා අසමානකම් අදාල | පැය 4 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | භූමිකාව නීතිය හඳුන්වා ඇත්තේ කෙසේද? Loco Parents හෙවත් ස්ථානීය දෙමාපිය සංකල්පය | | ලේඛන පරික්ෂා කරමින් කණ්ඩායම් වැඩ ලෙස විමසා බැලීම. Loco Parent සංකල්පයට සම්බන්ධ නඩු තීන්දු හා අධිකරණ ප්‍රකාශන විමසා බැලීම. | |
| 3 | අධ්‍යාපනය සඳහාම පැනවූ අණ පනත්. | අධ්‍යාපනයට බලපාන අණ පනත් පිළිබඳ ඉතිහාසය විමසා බැලීම.<br>• 1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනත තවමත් ක්‍රියාවට නැගෙන පනතකි. අවුරුදු 75කට වඩා පැරණියි. යාවත්කාලීන නොවීමේ ගැටලු.<br>අලුත් අධ්‍යාපන පනත් සඳහා මෙතෙක් ක්‍රියාත්මක කල පියවර විමසා බැලීම.<br>1968 ප්‍රසිද්ධ විභාග පනත ආදී තෝරාගත් පනත් කිහිපයක් විමසා බැලීම. | • අත් පත්‍රිකා<br>• අදාල පනත් සාරාංශ<br>• Multimedia Projector<br>• OHP<br>• White Board හා Marker | ආඥා පනත හා පනත අතර වෙනස හඳුනාගැනීම.<br>පනතක් නීතියක් වන අයුරු සාකච්ඡා කිරීම.<br>1939 අංක 31 දරණ ආඥා පනත ගැන සාකච්ඡා කිරීම.<br>අලුතෙන් අධ්‍යාපන පනතක් පිළිබඳ විමසා බැලීම.<br>ප්‍රසිද්ධ විභාග පනත ගැන සාකච්ඡා කිරීම. | පැය 4 |
| 4 | අධ්‍යාපනයට බලපාන රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන්. | රෙගුලාසිවල නෛතිකභාවය විමසා බැලීම.<br>ආයතන සංග්‍රහය ගැන විමසා බැලීම.<br>ආයතන සංග්‍රහයේ ගුරුවරුන්ට වැදගත් වන පරිච්ඡේද විමසා බැලීම.<br>ආයතන සංග්‍රහයේ දෙවන කොටස.<br>චක්‍රලේඛයක නෛතිකභාවය විමසා බැලීම.<br>පහසුකම් හා සේවා ගාස්තු චක්‍රලේඛය ආශ්‍රයෙන් චක්‍රලේඛයක අවශ්‍ය හා නෛතික | • අත් පත්‍රිකා<br>• ආයතන සංග්‍රහය<br>• ආයතන සංග්‍රහයේ දෙවන කොටසේ සාරාංශය<br>• වැදගත් චක්‍රලේඛ<br>• පහසුකම් හා සේවා ගාස්තු<br>• ශාරීරික දඬුවම්<br>• ළමයින්ගේ විනය<br>• පාසල් සංවර්ධන සමිති | රෙගුලාසි සංග්‍රහයක නෛතිකභාවය හඳුනාගැනීම.<br>ආයතන සංග්‍රහය විමසා බැලීම.<br>ආයතන සංග්‍රහයේ දෙවන කොටසේ සඳහන් රජයේ සේවකයන්ගේ විනය හා පැමිණිලි සම්බන්ධ රෙගුලාසි විමසා බැලීම.<br>පහසුකම් සේවා ගාස්තු චක්‍රලේඛයේ පිටපත් බෙදාදී සාකච්ඡා කිරීම.<br>කණ්ඩායම්වලට බෙදා එක් එක් චක්‍රලේඛය ගැන | පැය 4 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | වලංගුභාවය විමසා බැලීම.<br>ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන චක්‍රලේඛ විමසා බැලීම.<br>• පහසුකම් හා සේවා ගාස්තු<br>• ශාරීරික දඬුවම්<br>• ළමයින්ගේ විනය<br>• පාසල් සංවර්ධන සමිති | | පැවරුම් දී ඉදිරිපත් කිරීම් කිරීම. | |
| 5 | ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන පොදු හා පෞද්ගලික නීති. | ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන පොදු නීති<br>• මූලික අයිතිවාසිකම් නීතිය<br>• අපරාධ නීතිය<br>ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන පෞද්ගලික නීති<br>• දිලික්ත නීතිය<br>• පවුල් නීතිය<br>• නඩත්තු ආඥා පනත | • අත් පත්‍රිකා<br>• Multimedia Projector<br>• Power Point Presentations<br>• White Board හා Marker | පොදු නීතිය හා පෞද්ගලික නීතිය හැඳින්වීම.<br>මූලික අයිතිවාසිකම් නීතිය හැඳින්වීම.<br>• ළමා අයිතිවාසිකම්වලට බලපාන වගන්ති<br>අපරාධ නීතිය හැඳින්වීම.<br>• ළමා අයිතිවාසිකම්වලට බලපාන වගන්ති<br>පෞද්ගලික නීතිය හැඳින්වීම.<br>• දිලික්ත නීතිය<br>• පවුල් නීතිය<br>• නඩත්තු ආඥා පනත<br>කණ්ඩායම්වලට බෙදා සිද්ධි අධ්‍යයන අධ්‍යාපන සාකච්ඡා කිරීම.<br>පැවරුම් ඉදිරිපත් කිරීම. | පැය 4 |
| 6 | නීතිය ක්‍රියාවට නැගීමට සම්බන්ධ ව්‍යවහාරයන් හා සංවිධාන. | නීතිය ක්‍රියාවට නැගීමට සම්බන්ධ විධිවිධාන<br>අධිකරණ සංවිධාන ව්‍යුහය<br>• ශ්‍රේෂ්ඨාධිකරණය<br>• අභියාචනාධිකරණය<br>• මහාධිකරණය<br>• දිස්ත්‍රික් උසාවිය<br>• මහේස්ත්‍රාත් අධිකරණය | • අත් පත්‍රිකා<br>• Multimedia Projector<br>• Power Point Presentations | නීති ක්‍රමය හා විධිවිධාන අතර වෙනස හැඳින්වීම.<br>නීතිය ක්‍රියාවට නගන විධිවිධාන සංග්‍රහය හැඳින්වීම.<br>අධිකරණ ව්‍යුහය<br>• ශ්‍රේෂ්ඨාධිකරණ<br>• අභියාචනාධිකරණය<br>• මහාධිකරණය<br>• දිස්ත්‍රික් උසාවිය | පැය 4 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අධිකරණ නොවන සංවිධාන<br>• මානව අයිතිවාසිකම් කොමිසම<br>රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන්ට සම්බන්ධ විනය පරීක්ෂණ ගැ..... | | • මහේස්ත්‍රාත් අධිකරණය<br>අධිකරණ නොවන සංවිධාන<br>• මානව අයිතිවාසිකම් කොමිසම<br>කණ්ඩායම් වැඩ මගින් පැවරුම් හා ඉදිරිපත් කිරීම් කිරීම.<br>විනය පරීක්ෂණ සාකච්ඡා. | |

## 1. ළමයා හා වැඩිහිටියා අතර ඇති සම්බන්ධය නෛතික දෘෂ්ටි කෝණයෙන් විමසා බැලීම

අමතර ක්‍රියාකාරකම්

- අපරාධ නීතිය, මූලික අයිතිවාසිකම් නීතිය යන නීතිවලින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් ළමයා පිළිබඳ නිර්වචන විමසා බැලීම.
- ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් ළමයින්ගේ අයිතිවාසිකම් විමසා බැලීම.
- ළමා අයිතිවාසිකම් සුරැකීමේදී වැඩිහිටියන්ගේ වගකීම් හා යුතුකම්.

*අමතර කියවීම්*

- ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය.
- සමරසිංහ ගුණසේකර (2015) ළමා අයිතිවාසිකම් නීතිය
  සුනෙර ප්‍රකාශකයෝ, 64, දේවාල පාර, නුගේගොඩ.

*කණ්ඩායම් ක්‍රියාකාරකම් : 1*

- ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ ළමයා පිළිබඳ කර ඇති නිර්වචනය හා ළමයින්ගේ අයිතිවාසිකම්වලට අදාල ඉතාම වැදගත් වගන්ති 10ක් තෝරාගෙන සාකච්ඡා කරන්න.

## 2. ළමයාගේ හිමිකම් රැකීමේදී ගුරුවරයාගේ පැමිණීම සාර්ථකව ඉටු කිරීමට බලපාන නීති පද්ධතිය

ළමයින්ගේ හිමිකම්වලට බලපාන නීති පද්ධතිය මූලික කොටස් තුනකට බෙදා දැක්විය හැකිවේ.

- නීති
- රෙගුලාසි
- චක්‍රලේඛ නියමයන්

වැඩිහිටියන් විසින් ළමා අයිතිවාසිකම් සුරැකීමට ඉටුකල යුතු නීතියෙන් සුදුසු වගකීම් මූලික වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකියි.

- ළමයා පරිපෝෂණය කිරීම.
- ළමයාට රැකවරණය සැලසීම.

සාමාන්‍ය වශයෙන් අවුරුදු 18ට අඩු තැනැත්තෙකු ළමයෙකු වශයෙන් සලකන අතර ළමයා පිළිබඳව වැඩිහිටියන් විසින් සැලකිල්ලට ගත යුතු කරුණු කිහිපයක් වේ.

- ළමයා මානසික හා කායික වශයෙන් නොමේරූ තැනැත්තෙකු වේ.
- ළමයාට කැමැත්ත නම් හැකියාව නොමැති අතර ගිවිසුම්වලට අත්සන් කිරීම, යම් යම් නීතිමය කටයුතුවලදී කැමැත්ත ප්‍රකාශ කිරීම වැනි නොහැකියාවන් ඇති නිසා සැමවිටම ළමයෙකු ඔහුගේ දෙමාපියන් හෝ භාරකරුවකු විසින් පරිපෝෂණය කල යුතුය. එමෙන්ම, ළමයාට රැකවරණය සැලසිය යුතුය.
- පවුල තුල මෙම නීතිමය වගකීම් දෙමාපියන් හෝ භාරකරුවන්ට පැවරී ඇත.
- පාසල තුල මෙම වගකීම් පැවරී ඇත්තේ මුල් ගුරුවරයාට හා ගුරුවරුන්ටය.

පවුල තුලදී දෙමාපියන් විසින් ළමයාට ඉටුකරන නීතිමය වගකීම් පාසල තුලදී පැවරෙන මුල් ගුරුවරයා හා ගුරුවරුන් නීතිය විසින් හඳුන්වන්නේ ස්ථානීය දෙමාපියන් (Loco Parents) ලෙසය.

ගුරුවරු ළමයින් පිළිබඳව දෙමාපියන් ළඟට, බොහෝවිට දෙමාපියන් තරමට ම වැදගත් වන පිරිස වේ. ළමයෙකු ලොවට ජනිත කොට කායික හා මානසික වශයෙන් ඔහු ඇතිදැඩි කරන මවක හෝ පියෙකු මෙන් පාසල තුලදී ගුරුවරු ළමයින් මානසිකව හා කායිකව හදාවඩා ගනිති. ළමයා සම්බන්ධව ගුරුවරුන් සතු මෙම විශිෂ්ට වගකීම හැඳින්වීමට Loco Parents නම් ලතින් යෙදුම භාවිතා කරයි. "දෙමාපියන් සේ" යන්න එහි සිංහල අර්ථයයි. (සමරසිංහ ගුණසේකර: ළමා අයිතිවාසිකම්වලට බලපාන නීතිය (2.15) පිටුව 28)

පාසල තුලදී ළමයින් වෙනුවෙන් "දෙමාපියන් සේ" ගුරුවරුන් විසින් ඉටුකල යුතු වගකීම්වලට බලපාන නීති පද්ධතිය සැකෙවින් මෙසේය.

ළමයින්ගේ හිමිකම්වලට බලපාන නීති පද්ධතිය

- නීති
  - නීති
    - පොදු නීති
    - පෞද්ගලික නීති
  - නීතිවිධිවිධාන
    - අපරාධ
    - සිවිල්
- රෙගුලාසි
  - ආයතන සංග්‍රහයේ රෙගුලාසි
  - මුදල් රෙගුලාසි
- චක්‍රලේඛ නියමයන්
  - අධ්‍යාපන අමාත්‍යාංශ රෙගුලාසි
  - වෙනත් රෙගුලාසි

*කණ්ඩායම් ක්‍රියාකාරකම් : 2*

- ළමයාගේ අයිතිවාසිකම්වලට බලපාන නීතිවලට සම්බන්ධ නිදර්ශන සිදුවීම් 20ක් කණ්ඩායම් 4ක් අතර බෙදාදී, සාකච්ඡා කර, ඉදිරිපත් කිරීම් කිරීම.

*අමතර කියවීම්*

- සමරසිංහ ගුණසේකර (2015) ළමා අයිතිවාසිකම්වලට බලපාන නීතිය.

- සමරසිංහ ගුණසේකර (2009) පාසලට, ළමයින්ට හා ගුරුවරුන්ට බලපාන නොසැලකිල්ල පිළිබඳ නීතිය.

## 3. අධ්‍යාපනය සඳහාම පැනවූ අණ පනත්

ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුල අධ්‍යාපනය සඳහා ම පැනවූ නීති අල්පය. ඉන් 1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනත වැදගත් වේ. එම පනත අවුරුදු 77ක් පමණ පැරණි යල්පැනගිය පනතකි.

1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනත සැකෙවින් විමසා බැලීම.

මෑතකදී, එනම් 2013 දී නව අධ්‍යාපන පනතක් සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට දොලොස් දෙනෙකුගෙන් යුත් කොමිටියක් පත් කරන ලදී. එම යෝජනා සහිත පනත් කෙටුම්පත තවමත් සම්මත වී නොමැත.

අවුරුදු 77ක් තුල අධ්‍යාපන ක්‍රමය තුල මෙන්ම සමාජය තුල සිදුවූ වෙනස්කම්වලට අනුරූපව නව අධ්‍යාපන පනතක් පැනවීම අවශ්‍ය වේ.

අධ්‍යාපනය සඳහා පැනවූ තවත් පනත් කිහිපයක් වේ.

- ළමයින් හා බාලකයින් පිළිබඳ 1978 අංක 2 දරණ පනත
- ළමයින් හා බාලකයින් පිළිබඳ 1956 හානිකර ප්‍රකාශන පනත
- ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ (1973) පනත
- 1968 අංක 28 දරණ ප්‍රසිද්ධ විභාග පනත

*කණ්ඩායම් ක්‍රියාකාරකම් : 3*

- පනතක් නීතියක් වනු අයුරු මෑතකදී පැනවූ අධ්‍යාපනයට බලපාන පනතක් ආශ්‍රය කරගනිමින් විමසා බලන්න.

*වැඩිදුර කියවීම්*

- සමරසිංහ ගුණසේකර (2005) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට බලපාන නීතිය.
- සමරසිංහ ගුණසේකර (2010) පාසල් ළමයින් දැනගත යුතු නීතිය.

## 4. අධ්‍යාපනයට බලපාන රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන්

නීතියක් හා රෙගුලාසියක් අතර වෙනස හඳුනාගැනීම.

ආයතන රෙගුලාසි හා මුදල් රෙගුලාසි අතර වෙනස හඳුනාගැනීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ කාණ්ඩ අංක 1 - අධ්‍යාපනයට බලපාන රෙගුලාසි විමසා බැලීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ කාණ්ඩ අංක 2 - රජයේ සේවකයින්ගේ සාමාන්‍ය හැසිරීම හා විනය පාලනයට අදාල රෙගුලාසි විස්තරාත්මකව විමසා බැලීම.

- සාමාන්‍ය හැසිරීම
- බීමත්කම, මත්පැන් ගඳ හෝ විෂ මත්ද්‍රව්‍ය භාවිතය
- තෑගිබෝග හා ආධාර ලැයිස්තු

- මුදල් කරදර
- පෞද්ගලික කාර්යයන් සඳහා රජයේ මුදල් පාවිච්චි කිරීම
- පුවත්පත්වල හෝ මහජනයාට හෝ නිල ප්‍රවෘත්ති සැපයීම
- පොත්පත් ලියා ප්‍රසිද්ධ කිරීම හා ගුවන් විදුලි කතා ප්‍රචාරය කිරීම

රෙගුලාසි උල්ලංඝනය කිරීම සම්බන්ධ විනය කාර්ය පටිපාටිය

- සුලු වැරදි
- බරපතල වැරදි
- සුලු දඬුවම්
- බරපතල දඬුවම්
- විනය පරීක්ෂණ ක්‍රියා පටිපාටිය

**චක්‍රලේඛ නියමයන්වල නෛතිකභාවය විමසා බැලීම**

- තෝරාගත් චක්‍රලේඛ 5ක් ආශ්‍රයෙන් චක්‍රලේඛවල නෛතිකභාවය විමසා බැලීම.
- ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන චක්‍රලේඛ තෝරාගෙන විමසා බැලීම.

*කණ්ඩායම් ක්‍රියාකාරකම් : 4*

කණ්ඩායම් 4කට බෙදී පහත සඳහන් රෙගුලාසි හා චක්‍රලේඛ ගැන සාකච්ඡා කර පැවරුම් ඉදිරිපත් කිරීම.

- ආයතන සංග්‍රහය හැඳින්වීම
- ආයතන සංග්‍රහයේ දෙවන කොටස - සාමාන්‍ය හැසිරීම හා විනය පාලනය
- ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන චක්‍රලේඛ දෙකක්
- ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන චක්‍රලේඛ දෙකක්

*අමතර කියවීම්*


- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආයතන සංග්‍රහය කාණ්ඩ 1 හා කාණ්ඩ 2

## 5. ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන පොදු හා පෞද්ගලික නීති.

නීති මූලාශ්‍ර සැකෙවින් විමසීම

- නීතිකරණය
- නඩු තීන්දු
- සිරිත්

නීති වර්ග විමසා බැලීම



*ළමයින්ගේ අයිතිවාසිකම්වලට බලපාන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීති විමසීම*

- රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්ම
- මූලික අයිතිවාසිකම් නීතිය

ළමා අයිතිවාසිකම්වලට බලපාන අපරාධ නීති විමසා බැලීම

- ළමයින්ට ශාරීරික දඬුවම් පැමිණවීම
- පාසල් ළමුන්ට එරෙහිව සිදුවන කාම අපරාධ හා අස්වභාවික වැරදි
- දෙමාපියන් විසින් ළමයින් අත්හැර දැමීම

ළමා අයිතිවාසිකම්වලට බලපාන පෞද්ගලික නීති

- නොසැලකිල්ල නිසා ළමයින්ට සිදුවිය හැකි හා ගුරුවරුන්ගේ වගකීම් පිළිබඳ දිලික්ත නීතිය
- දිලික්ත නීතිය අධ්‍යාපනයට බලපාන ආකාරය
- පවුල් නීතිය පාසලට බලපාන ආකාරය

*කණ්ඩායම් ක්‍රියාකාරකම් : 5*

- ළමයින්ට එරෙහිව සිදුවන අපරාධමය වැරදි හා දිලික්ත වැරදි පිළිබඳ මෑතකාලීන සිදුවීම් ගෙනහැරපාමින් අපරාධ නීතිය හා දිලික්ත නීතිය ළමා අයිතිවාසිකම්වලට බලපාන ආකාරය විමසීම.

*වැඩිදුර කියවීම්*

- සමරසිංහ ගුණසේකර (1994) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට බලපාන නීතිය.
- සමරසිංහ ගුණසේකර (2009) පාසල් ළමයින්ට හා ගුරුවරුන්ට බලපාන නොසැලකිල්ල පිළිබඳ නීතිය.
- නීතිඥ ජයමාන්න ස....... - ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා වූ නීතියේ නව සංශෝධනය (නීතිය සහරාව අංක 4 කලාපය)

## 6. නීතිය ක්‍රියාවට නැගීමට සම්බන්ධ ව්‍යවහාරයන් හා සංවිධාන.

නීති, රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන් ක්‍රියාවට නැගීමට සම්බන්ධ විධිවිධාන හා සංවිධාන ඇති බව තේරුම් ගැනීම.

- නීති විධිවිධාන හා සංවිධාන
  - අපරාධ නීති විධිවිධාන
  - සිවිල් නීති විධිවිධාන
  - අධිකරණ
    - ශ්‍රේෂ්ඨාධිකරණය
      - අභියාචනාධිකරණය
        - මහාධිකරණය
          - දිසා අධිකරණය
            - මහේස්ත්‍රාත් අධිකරණය
  - අධිකරණ නොවන සංවිධාන
    - මානව අයිතිවාසිකම් කොමිසම

රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන් ක්‍රියාවට නැගීමේ **විධිවිධාන**

- වැරදි
  - සුළු වැරදි
  - බරපතල වැරදි
- දඬුවම්
  - සුළු දඬුවම්
  - බරපතල දඬුවම්
- විනය පරීක්ෂණ පැවැත්වීමේ විධිවිධාන

*කණ්ඩායම් ක්‍රියාකාරකම් : 6*

කණ්ඩායම් කණ්ඩායම් 4කට බෙදී පහත සඳහන් මාතෘකා පිළිබඳ සාකච්ඡා කර පැවරුම් ඉදිරිපත් කිරීම.

- ශ්‍රේෂ්ඨාධිකරණය හා එහි බලතල
- මහාධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය හා බලතල
- රෙගුලාසි ක්‍රියාවට නැගීමේ විධිවිධාන
- චක්‍රලේඛ නියමයන් ක්‍රියාවට නැගීමේ විධිවිධාන

*අමතර කියවීම්*

- අපරාධ විධිවිධාන සංග්‍රහය.
- සිවිල් විධිවිධාන සංග්‍රහය.
- සමරසිංහ ගුණසේකර - අධ්‍යාපනයට බලපාන නීතිය